# කොරියානු බෞද්ධ ඉතිහාසයේ වර්ධනය පිළිබඳ විමසීමක්

කැලණිය විශ්වවිද්‍යාලයේ, දර්ශන අංශයේ මහාචාර්ය
**දයාරත්න එදිරිසිංහ** (බී. ඒ. ගෞරව, (විද්‍යෝදය) එම්. ඒ. ඩොංගුක්, කොරියානු භාෂා සහතිකය යොල් ජාතික)

භාරතයෙන් ඈත පෙරදිග රටවලට ලැබුණු ප්‍රධානතම දායාදය නම් බුද්ධාගමයි. හින්දු බලය වර්ධනය වීමත් සමග විවිධ මර්දනකාරී අනතුරුයන්ට මුහුණ පෑ ඉන්දියානු බෞද්ධ භික්ෂූන් චීනය හා තදාසන්න රාජ්‍යයන්ට ආත්මාරක්ෂාව තකා පලා ගිය බවට කෙතෙකුත් සාක්ෂ්‍ය ඇත. ඈත පෙරදිග බෞද්ධ චින්තනය ව්‍යාප්ත වූ අවධියෙහි වඩාත් ප්‍රචලිත වූයේ මහායාන සම්ප්‍රදායයි. මේ නිසා චීන රාජ්‍යයන්ට ප්‍රවේශවූ බුද්ධාගම මහායාන බුද්ධාගම ලෙස සැලකීම වඩාත් නිවැරදිය. කොරියාවට බෞද්ධාගම ප්‍රවේශ වූයේ චීන රාජ්‍යයන්ගේ බලපෑම නිසාය. කොරියානු රාජ්‍යයන්හි අනුග්‍රහය හා බලපෑම හේතුකොට ගෙන ජපානයට බෞද්ධ ධර්මයේ ආස්වාදය ලබාගැනීමට හැකිවූ බව පෙනේ.

මෙහිදී කොරියාව යනුවෙන් අදහස් කරනු ලැබුවේ දැනට උතුරු කොරියාව, දකුණු කොරියාව මැංචූරියාවේ දකුණු කොටස සහ දකුණු සයිබීරියාවට අයත් කොටස්ය. කොරියාව තුන් පැත්තකින්ම වටවී ඇත්තේ සමුද්‍රයෙනි. අනික් කොටස ආසියානු මහාද්වීපයට අයත් චීනය සහ රුසියාව යන රටවල දේශ සීමාවනට සම්බන්ධවී ඇත. ආදි චීනයේ මෙන්ම පැරණි කොරියාවෙහි ද තැනින් තැන බිහිවූ ස්වාධීන රාජ්‍ය හඳුනාගත හැකිය. විවිධ භාෂා, ප්‍රදේශ භේද ජනගෝත්‍රික ප්‍රභේද හේතුකොටගෙන මෙම රාජ්‍ය ගොඩනැඟුණ බව පෙනේ. කොරියාවේ ජීවත්වන්නේ ‘හන්’ වර්ගයට අයත් ජනයාය, මාහන්, චින්හන් සහ පියොන්හන් නම් කොටස් තුනට ‘හන්’ වර්ගයා වෙන්විය.[1] මෙම හන් වර්ගයා ගොඩනැඟූ පැරණි චෝසන් නම් රාජ්‍යයක් විය. එය පසුව තවත් ස්වාධීන රාජ්‍ය තුනකට බෙදී වෙන් වෙන්ව පාලනය ගෙන ගියේය.

## ශිල්ලා, කොගිරියෝ සහ පෙක්චේ රාජ්‍යයන්හි බුද්ධාගම

කොරියානු අර්ධද්වීපය ස්වාධීන රාජ්‍ය තුනක් ලෙස පැවැති ආරම්භක අවධිය කොරියානු දේශපාලන ඉතිහාසයෙහි ඉතා වැදගත් ස්ථානයක් හිමි කරගනු ලැබේ. කොරියානු අර්ධද්වීපයෙහි පැවැති ශිල්ලා, කොගිරියෝ සහ පෙක්චේ යන රාජ්‍ය තුන පසුව ශිල්ලා රාජ්‍යය යටතේ එක රාජ්‍යයක් ලෙස ඒකාබද්ධ විය.[2] කොරියාවට බෞද්ධාගම ප්‍රථමයෙන්ම ප්‍රවේශ වූයේ ස්වාධීන රාජ්‍ය තුනක් වශයෙන් මෙම පැවැති අවධියේදීය.[3] 4 වන ශතවර්ෂයෙදී පමණ ප්‍රථමයෙන්ම මින් එක් රාජ්‍යයක්වූ කොගිරියෝ රාජ්‍යයට බෞද්ධාගම පිළිබඳ දැනීමක් ලබාගැනීමට හැකිවූ බව ඓතිහාසික වාර්තා වලින් ප්‍රකට වේ. ක්‍රි. ව. 372 දී පමණ කොගිරියෝවෙහි රජ වශයෙන් ක්‍රියා කළ සොසෙරිම් ගේ රාජ්‍ය පාලනයෙහි දෙවන වර්ෂයේදී සුන්ඩෝ නම් ඉන්දියානු භික්ෂුව විසින් බෞද්ධ සූත්‍ර සහ බුදුපිළිම කිහිපයක් රැගෙන එම රාජ්‍යයට පැමිණි බව වාර්තාවේ. ක්‍රි. ව. 384 දී ඉන්දියානු භික්ෂුවක් වූ මරනන්ද පෙක්චේ රාජ්‍යයට ඇතුළු වූයේ චීනය හරහාය. මේ අවධියේ පෙක්චේ පාලකයා වූයේ චිම්යෝය. මෙම

රාජ්‍ය දෙක බෞද්ධාගමට හොඳ ප්‍රතිචාරයක් දැක්වූ අතර ඒ තත්ත්වය යටතේ මහත් බෞද්ධ ප්‍රබෝධයක් ඇතිවිය. ඒ නිසා බෞද්ධ විහාරස්ථාන රැසක්ම ඉදි විය.

ශිල්ලා රාජ්‍යයට බෞද්ධාගම පැමිණියේ කොගිරියෝවට බෞද්ධාගම පැමිණ අර්ධ ශතවර්ෂයක් පමණ ගතවූ පසුය.[5] ශිල්ලා රාජ්‍යයට ඉන්දියානු ප්‍රභවයක් ඇති බෞද්ධාගම රැගෙන ආවේ කොගිරියෝවෙහි භික්ෂුවක් වූ මුක්නෝජා විසිනි.[6] මෙම සිදුවීම නුල්චි රාජ්‍ය සමයෙහි (ක්‍රි. ව. 417 – 437) දී සිදුවූ බව ප්‍රකාශ වේ. ශතවර්ෂයක පමණ කාලයක් තුළ බෞද්ධාගම එතරම් වැදගත් වූ බවක් නොපෙනේ. බෞද්ධ ධර්මදූත ව්‍යාපාරයන් ද ප්‍රබල නොවීය. පුනුසුන් රාජ්‍ය සමයෙහි (ක්‍රි. ව. 328) ජීවත් වූ පාක් යුම්-චොක්ගේ (ඉඩාඩොන්) විසින් බෞද්ධ කටයුතු කරගෙන යැමට මහත් අනුබලයක් දක්වනු ලැබීය.

බෞද්ධාගම වඩාත් ප්‍රචලිත වූයේ ජනතාවට සෞභාග්‍ය ලබාදෙන රටට සුභදායක වූ ආශ්චර්යමත් ආගමක් වශයෙනි. සමකාලීන විශ්වාස සහ සිරිත් විරිත් සමග එකට සම්මිශ්‍රණය වූ බෞද්ධ චින්තනය දිනෙන් දිනම ජනප්‍රිය වන්නට විය. විදේශ සතුරු බලවේගවලට එරෙහිව රාජ්‍ය පාලකයන්ගේ සුභසිද්ධියට යොදගත හැකි ආගමක් වශයෙන් මෙම නව ආගම ජනතාව අතර ප්‍රචලිත විය. මුල් අවධියෙහි මෙම රාජ්‍ය තුනෙහි බුද්ධාගම වර්ධනයට පත්වූයේ එකිනෙකට වෙනස් පසුබිම යටතේය.

ඉන්දියානු භික්ෂුවක් වූ සුන්ඩෝ ගේ පැමිණීමෙන් වර්ෂ දෙකකට පසුව අදෝ නම් භික්ෂුව කොගිරියෝ රාජ්‍යයට පැමිණි බව සඳහන්වේ. ක්‍රි. ව. 375 දී ඉන්දියානු භික්ෂුවක් වූ අදෝ විසින් සුන්ග්මුන් සහ ඉබොල්හන් යන විහාරස්ථාන ගොඩනැගීමට පුරෝගාමී විය. එසේම ක්‍රි. ව. 392 කොකුවූවන් රජතුමා විසින් මහජනතාව වෙත නිකුත් කර ප්‍රකාශකයකින් කියා සිටියේ ජනතාව බුද්ධාගම ඇදහිය යුතු බවය. හතරවන සියවයේදී ගොකිරියෝවෙහි පාලනය ගෙන ගිය තවත් රජකෙනෙකුවූ ක්වංකෙටෝ බෞද්ධ විහාරස්ථාන නවයක් පියොංයැංහි ගොඩනහනු ලැබීය. එසේම දක්ෂිණභාගයේ පිහිටි රාජ්‍යයන් මගින් එල්ලවන සතුරු ආක්‍රමණවලින් බේරීම සඳහා එම විහාරස්ථානයන්හි ශාලාවන් ඇති කළ යුතු බවත් ඒවායෙහි නීති පතා වන්දනාමාන පැවැත්විය යුතු බවත් නියෝග කොට තිබුණි. මේ අවධියේම චීනයෙන් පැමිණි භික්ෂුවක් විසින් ලියාඩිතොන් පළාතෙහි ධර්මප්‍රචාර කටයුතුවල නිරත වූ අතරම චීනයෙන් ගෙන ආ සූත්‍ර හා විනය ග්‍රන්ථ කොගිරියෝ ජනතාව අතට පත් කළේය. මේ යුගයෙහි එනම් ක්‍රි. ව. 576 පමණ වනවිට බොහෝ කොරියානු භික්ෂූන් වැඩිදුර ධර්මය ඉගණීම සඳහා චීනයට ගිය බව පෙනේ. පුන්ග්වන් රජ සමයෙහි යූයුන් මෙවැනි භික්ෂුවකි. මෙසේ චීනයේ අධ්‍යාපනය ලැබූ සමහර භික්ෂූන් සර්වස්තිවාදීන් ලෙස සැළකුණ බව පැහැදිලිය. තවත් සමහර භික්ෂූන් චීනයෙහිදී ප්‍රගුණ කළ ටෙන්දයි චින්තනය කොරියාවෙහි ඉගැන්වීමෙහි නිරත වූ බව පෙනේ.

පෙක්චේ රාජ්‍යයෙහි වැඩි කලක් ගතවීමට ප්‍රථම බෞද්ධාගම එරට ජන ජීවිතයට ප්‍රවේශ විය. මේ අවධියේ වැදගත් සිදුවීමක් නම් කියුටික් නම් භික්ෂුව ඉන්දියාවේ බෞද්ධ ධර්මය අධ්‍යයනය කර සංස්කෘත සූත්‍ර රාශියක් ද රැගෙන පැමිණීමයි. එවකට සිටි රාජ්‍ය පාලකයාගේ අනුග්‍රහය ඇතිව සියුන්රියන් නම් විහාරස්ථානය මේ හිමියන් ඉදිකළ අතර, ඉන්දියාවේ සිට රැගෙන ආ සංස්කෘත සූත්‍ර කාණ්ඩ ඇතුළත් ග්‍රන්ථ 27 ක් කොරියානු භාෂාවට පරිවර්තනය කළේය. මේ වගකිව යුතු කාර්යය ඉටු කිරීමට උගතුන් රැසකගේ සහාය ලබාගන්නා ලදී. පසුව දමොක් සහ හියුඉන් නම් භික්ෂූන්ගේ ආධාර ඇතිව තවත් සූත්‍ර කාණ්ඩ 30 ක් පරිවර්තනය කිරීම මේ අවධියේ සිදුවිය. මේ සූත්‍ර පරිවර්තනය සඳහා පෙරවදනක් සපයා තිබුණේ ද එවක රජතුමා

විසිනි. ක්‍රි. ව. 541 දී එවකට සිටි රජතුමා විසින් චීනයෙන් 'නිර්වාණ සූත්‍ර' රැගෙන ඒමට දූත පිරියක් යැවූ බවද වාර්තා වේ. මේ අවධියේ හිටි බුදු පිළිම නිර්මාණය ද ආරම්භ වූ බවට සාක්‍ෂ්‍ය ඇත. එසේම ක්‍රි. ව. 595 ප්‍රාණඝාතය වැරදි සහගත ක්‍රියාවක් වශයෙන් රජතුමා අතින් ප්‍රකාශයට පත් විය.

ක්‍රි. ව. 600–640 තෙක් රජ කළ මු රජතුමා විසින් මිරුක් විහාරස්ථානය ඉදි කරන ලදී. මෙය එවකට පෙරදිග පැවැති විශාලතම බෞද්ධ විහාරස්ථානය ලෙස ප්‍රසිද්ධියට පත්විය. තනිකර ගලෙන් ඉදිකරනු ලැබූ මෙම පූජනීය ස්ථානය අදත් දැක ගත හැකිය. ශිල්ලා හා පෙක්චේ රාජ්‍යයන්හි බෞද්ධාගම ව්‍යාප්ත වීමෙහි ලා ප්‍රබල වශයෙන් බලපෑවේ රාජ්‍ය අනුග්‍රහයයි. හයවන ශතවර්ෂය පමණ වන විට බෞද්ධ සංස්කෘතිය එම රටවල ජන ජීවිතයේ ඉතා වැදගත් ස්ථානයක් ළඟා කරගනු ලැබීය. චීනයේ අධ්‍යාපනය හදරා පැමිණි කොරියානු භික්ෂූන් කොරියානු අර්ධද්වීපයෙහි බෞද්ධ කටයුතු උනන්දුවෙන් කරගෙන ගියේය. විශේෂයෙන්ම කොගිරියෝ සහ පෙක්චේ රාජ්‍යයන්හි අනුග්‍රහය ඇතිව ජපානයෙහි බෞද්ධ ප්‍රචාරක කටයුතු සඳහා අනුග්‍රහය දක්වනු ලැබීය.

ක්‍රි. ව. 584 සහ 595 දී පිළිවෙලින් ජපානයට ගිය නියුහියුන් සහ වායෝ නම් බෞද්ධ භික්ෂූන් දෙපළ එවකට ජපන් කුමරකු වූ සොටෝකුගේ ආචාර්යවරුන් වශයෙන් කටයුතු කළහ. මෙම භික්ෂූන් ජපානයට ගෙන ගියේ චීනයේදී ප්‍රගුණ කරනු ලැබූ 'සන්ලූන්' නිකායයි. සූන්යං රාජ්‍ය සමයෙහි (ක්‍රි. ව. 590-617) බොහෝ කොරියානු භික්ෂූන් වහන්සේලා සමුද්‍රතරණය කොට ජපන් දූපත් වෙත ගමන් කළ බවට නොරතුරු රාශියක් ඇත. දැනට ජපානයේ නාරාහි හොරේයිජී විහාරස්ථානයේ ඇති බිතු සිතුවම් අතුරින් රාශියක් නිර්මාණය කොට ඇත්තේ මෙසේ කොරියාවෙන් ජපානයට පැමිණි ඩම්ජින් නම් බෞද්ධ භික්ෂුව විසිනි. (ක්‍රි. ව. 610)

පෙක්චේ රාජධානිය මගින්ද බෞද්ධ ධර්මය ජපානයෙහි ව්‍යාප්ත කරවීම සඳහා කළ සේවය අසීමිතය. ජපානයෙහි බෞද්ධ ප්‍රබොධයෙහි ස්වර්ණමය අවධියක් බිහි විය. අසූකා සහ නාරා යන යුගවල බෞද්ධ චින්තනයෙන් ඔපවත් වූ කලාව, සංස්කෘතිය හා ඉතිහාසය ජපානයෙහි මහත් ආලෝකයක් ප්‍රකට කළේය.

ශිල්ලා රාජධානියෙහි බෞද්ධ කටයුතු කොරියාවෙහි බෞද්ධාගම ව්‍යාප්තියට මහත් බලපෑමක් කළේය. චින්නියුන් රජතුමා (540-575) විසින් හියුන්යියුන්, හ්වංයොන් සහ පුජ්වූ යන ප්‍රධාන විහාරස්ථාන ගොඩනැඟිය. මුලදී කොගිරියෝවෙහි බෞද්ධ භික්ෂූන්ගෙන් බෞද්ධ ධර්ම දූත කටයුතු මෙහෙයවුවද පසුව ධර්මදූත කටයුතු සහ ධර්මය ඉගෙනීමට ශිල්ලා භික්ෂූන් ඉන්දියාවට සහ චීනයට යවනු ලැබීය. මෙසේ විදේශයන්හි ධර්මය හැදෑරූ භික්ෂූන් මගින් මෙන්ම චීනයෙන් ගෙන ආ සූත්‍ර හා විනය ග්‍රන්ථ ආභාසයෙන් ද ශිල්ලා රාජ්‍යයෙහි බෞද්ධ ප්‍රබෝධයක් ඇතිවිය.

මෙසේ කොරියාවේ ආරම්භ වූ බෞද්ධ චින්තනය එරට පමණක් නොව විශේෂයෙන්ම ජපානයෙහිද බෞද්ධ කටයුතු ව්‍යාප්ත කිරීමෙහිලා මහත් අනුබලයක් වූ බව දක්විය හැකියි. කොරියාවේ බෞද්ධ චින්තනය ප්‍රචලිත නොවූයේ නම් සෑහෙන දුරට ඈත පෙරදිග සංස්කෘතිය හා ඉතිහාසය වෙනස්වීමට ඉඩ තිබුණි. කොරියානු ශෛලියකින් බෞද්ධ පොත පත රචනාවීමත් බෞද්ධ කලාවස්තු නිර්මාණය වීමත් ඉතා වැදගත්ය. විශේෂයෙන් 'ත්‍රිපිටක කොරියානා' නම් කොරියානු ත්‍රිපිටකයත් එසේම 'සොක්කුරාම්' වැනි බුදුපිළිම නිර්මාණයත් කොරියානු බෞද්ධ චින්තනයෙහි මහඟු දායාද වන්නේය. මේ හැමටම වඩා කොරියානු ජනතාවගේ ජනජීවිතය බෞද්ධ චින්තනයෙන් ඔප මට්ටම් වීම සඳහන් කළ යුතු වැදගත්ම කරුණයි.

## ඒකාබද්ධ ශිල්ලා රාජ්‍ය සමයෙහි බුද්ධාගම

ඒකාබද්ධ ශිල්ලා රාජ්‍ය සමය යනු කොරියාවේ තිබූ කොගුරියෝ සහ පෙක්චේ යන රාජ්‍ය දෙක පරදවා ශිල්ලා රාජ්‍ය යටතේ එක්සත් එක රාජ්‍යයක් බිහිකර ගැනීමේ අවධියයි. ශිල්ලා රාජ්‍ය නිල වශයෙන් බෞද්ධාගම පිළිගත් රාජ්‍යයකි. කොරියානු බුද්ධාගමෙහි ස්වර්ණමය යුගය ශිල්ලා රාජ්‍ය සමයයි. (ක්‍රි. ව. 668–935) මෙය චීනයේ තං රාජ්‍ය සමයට සමකාලීන වේ. රජවරුන් ප්‍රභූවරුන් සහ සාමාන්‍ය මහජනයා යන ත්‍රිවිධ පාර්ශ්වය බෞද්ධ ජීවිතයක් අනුව ගත කිරීමට තීරණය කළේ මේ අවධියේදීය.[7] උගත් බෞද්ධ භික්ෂූන් වහන්සේ පමණක් නොව පැවිදි වූ රජදරුවන් ද චීනයේ ධර්ම අධ්‍යයනයට ගමන් කිරීම මේ අවධියේ සිදුවූවකි.

චීනයේ එවකට වර්ධනය වී පැවැති විවිධ බෞද්ධ නිකාය කොරියාවට ප්‍රවේශවීම ශිල්ලා යුගයේ සිදුවූ වැදගත් සිද්ධියකි. සොන්, කියෝ වැනි නිකාය මේ අවධියේ ප්‍රචාරයට පත්විය.[8] ශිල්ලා යුගයෙහි වර්ධනය වූ අනෙක් නිකාය අතර, විනය, නිර්වාණ, පුප්සුන්, අවතම්සංක සහ පූප්සං නිකාය සඳහන් කළ හැකිය. ඒවා පිළිවෙලින් චාජන්, පොඩුක්, වං නොයෝ, යූසං සහ චින්හියෝ යන භික්ෂූන්ගේ නායකත්වයෙන් ප්‍රචලිත විය. එසේම එම නිකායන්ට සම්බන්ධ මූලස්ථාන විහාර ලෙස ටොංඩෝ, කියොංබුක්, පුන්හ්වන්, පොසොක් සහ කියුම්සාන් යන ස්ථාන සඳහන් කළ හැකිය. මේ අවධියේ ජීවත් වූ 'හෝචෝ' නම් ශිල්ලා භික්ෂුව චීනය හරහා ඉන්දියාවට ප්‍රවේශ වී එතැනින් මධ්‍ය ආසියානු රාජ්‍ය රාශියකට සංචාරය කිරීමෙන් පසුව කළ සංචාරක සටහන් වාර්තාව එම අවධියේ ඉන්දියාව හා තදාසන්න රාජ්‍ය රාශියක දේශපාලන සංස්කෘතික, ආර්ථික හා සමාජ තොරතුරු දැනගැනීමට උපකාරී වන මාහැඟි ග්‍රන්ථයකි.

## කොරියෝ යුගයේ බුද්ධාගම (ක්‍රි. ව. 918 - 1392)

ශිල්ලා රාජ්‍ය සමය කෙළවරවීමත් සමඟ කොරියෝ රාජ්‍යපාලනය ආරම්භ වේ. පොදු ජනයා, නිලධාරීන් හා රජවරුන් එකතුව පවත්වාගෙන ගිය බෞද්ධ ජීවිතය ඉතා යහපත් එකක් විය. එසේම පොදුජනයාට මේ හේතුකොටගෙන රාජ්‍ය පාලනයෙහි උසස් තනතුරු ලබාගැනීමට හැකියාවක් ලැබුණි. මේ අවධියෙහි විහාරස්ථාන ගොඩනැඟීම, බෞද්ධ උත්සව පැවැත්වීම සහ බෞද්ධ සූත්‍ර මුද්‍රණය වැනි කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය නොමඳව ලැබුණි. විහාරස්ථානයන්හි සුභසිද්ධිය සඳහා රජයේ ඉඩම් පරිත්‍යාග කළ අතර සිල්වත් භික්ෂූන්වහන්සේලා රජතුමාගේ උපදේශකවරුන් වශයෙන් පත්කරනු ලැබීය. මේ නිසා භික්ෂූන්වහන්සේලා රජතුමාගේ පාලනයට අවශ්‍යයෙන්ම සහාය වූ පිරිසක් විය. රාජ්‍ය බදු සහනයන් ද බෞද්ධ භික්ෂූන්ට සහ විහාරස්ථානවලට ලැබුණි. මේ නිසා රජ පවුල්වල කුමාරවරුන් මෙන්ම උසස් පවුල්වල කුල දරුවන් ශාසනගතවීම සුලභ දර්ශනයක් බවට පත්වී තිබුණි. රජ මාළිගාවේ කටයුතු සියල්ලටම බෞද්ධ බලපෑම වර්ධනය වූ අතර විවිධ ගුඪ හා මිත්‍යා විශ්වාස මේ සඳහා මිශ්‍රණය විය. පොදු ජනයාගේ ආගමික විශ්වාසයන්ට වඩාත් බලපෑවේ ආශ්චර්යවත් දේ කළ හැකි ආගමක් ලෙස බෞද්ධාගම පිළිගැනීමට ඔවුන් උනන්දු වීමයි.

මෙම පසුබිම කොරියානු බෞද්ධ චින්තනයේ පරිහානිය පෙන්නුම් කරන කැඩපතක් බඳු විය. රාජ්‍ය පාලකයන් ප්‍රභූවරුන් සහ පොදු ජනයා ද බෞද්ධාගම තම අඩු ලුහුඬුකම් මකාගැනීමට ආධාර කරගත්තේය.

ක්‍රි. ව. 918–944 කාලයෙහි රජවූ කොරියෝ රජතුමා බෞද්ධාගම රටේ සෞභාග්‍යයටත් රටේ ආරක්‍ෂාවටත් බලපාන බව පිළිගත්තෙකි. ඔහු විසින් පියොංයැං

නගරයෙහි නවමහල් බෞද්ධ ස්තූපයක් කරවනු ලැබීය. ඔහු විසින් සියළු දෙනා විසින් පිළිපැදිය යුතු දස විධ සමාජ ධර්ම ප්‍රකාශයට පත් කරන ලදී. විශාල වශයෙන් බෞද්ධ විහාරස්ථාන ගොඩනැගීම මේ වකවානුවේදී සිදුවිය.

මේ අවධියේ සිදුවූ වැදගත් කරුණක් නම් කාලයක් තිස්සේ වෙන්ව පැවැති සොන් සහ කියෝ බෞද්ධ නිකාය දෙකෙහි එකමුතුවයි. මේ වාකවානුවෙහි ජීවත්වූ වෙක්වන් නම් භික්ෂූන් වහන්සේ විසින් රචිත චතුර්විධ ටෙන්දයි ඉගෙනීම, නම් ග්‍රන්ථය චීනයේ අධ්‍යයන කටයුතු හමාර කිරීමෙන් පසුව පළකරනු ලැබීය. මෙම ග්‍රන්ථය පසුව චීනයේ හා ජපානයෙහි ටෙන්දයි බෞද්ධ චින්තනය අධ්‍යයනයෙහිලා වැදගත් තැනක් හිමිකර ගත්තේය. හුන් ජොන් රජතුමාගේ කාලයෙහි (ක්‍රි. ව. 1010–1031) කොරියානු ත්‍රිපිටකය ලෑලි තහඩුවල ලේඛනගත කිරීම ආරම්භ වූ අතර ඒ අවසානවූයේ වර්ෂ 40 කට පසුවය.

කොරියෝ යුගයේ අවසාන භාගයෙහි බෞද්ධ භික්ෂූන්වහන්සේලා මහත් සුඛෝ–පභෝගී ජීවිතයකට හුරුපුරුදු වූහ. ඔවුහු පොදු ජනයාගෙන් ඈත්වූ සැප පහසු දිවියක් ගත කළහ. මේ අවධියෙහි ජීවත් වූ ඉතාම ප්‍රසිද්ධ භික්ෂූන්වහන්සේ නමක් ලෙස චිනුල් (1210 – 1258) සඳහන් කළ හැකිය. ධ්‍යාන හා ප්‍රඥා යන මාර්ග දෙක වර්ධනය කිරීමටත් ඒ මාර්ග දෙක එක් කිරීමටත් ඔහු මහ පැදුවේය. ප්‍රථම කොරියානු ත්‍රිපිටකය සතුරු ආක්‍රමණවලින් විනාශ වූ පසුව කොජෝන් රජතුමා විසින් (ක්‍රි. ව. 1214 – 1259) නැවත කොරියානු ත්‍රිපිටකය ලේඛනාරූඪ කිරීමේ කාර්යය ආරම්භ කරනු ලැබීය.

චුන්ග්යුල් රාජ සමයෙහි (ක්‍රි. ව. 1275 – 1308) දී උතුරු දිග සතුරු ආක්‍රමණ වැඩි විය. රජයේ ස්ථාවර භාවය සළුල විය. චීන යුආන් අධිරාජ්‍යයන්ගේ ආක්‍රමණය තර්ජන එල්ලවිය.

කොන්මින් රාජ්‍ය සමයෙහි (ක්‍රි. ව. 1352 – 1372) දී රජතුමා විසින් ඉතා දූෂිත භික්ෂුවක ලෙස ප්‍රසිද්ධවූ සින්ඩොන් නම් භිමිසන් මාහිමි තනතුරට පත් කරනු ලැබීය. මේ නිසා පිරිහී ගිය බෞද්ධාගම තවත් ප්‍රපාතයට වැටීමට එය ඉවහල් විය.

බෞද්ධ ව්‍යාපාර කොරියෝ රාජධානියේ අවසානයෙහි කැපී පෙනුන ලක්ෂණ–යකි.[10] මේ අවධියෙහි කොන්ෆියුසියානු දර්ශනය බෞද්ධාගම ගැන කළ කිරුණ උගතුන්ගේ අවධානයට පත්වූවකි.[11] මේ අවධියෙහි ජීවත් වූ චුන් – ඩෝ – ජුන් නම් කොන්ෆියුසියානු දර්ශනිකයා විසින් ඉන්දියානු ආගම සදචාරය බිඳ දමන රටට හානි කරන ආගමක් බව සඳහන් කළේ ය. මේ බෞද්ධ විරෝධී ව්‍යාපාරය අනුක්‍රමයෙන් වර්ධනයට පත්විය.

බෞද්ධ ජනයාගේ හා රජවරුන්ගේ වැඩි අවධානය යොමුවූයේ සෞභාග්‍ය ළඟා කරගැනීමටත් වන්දනාමාන කිරීමටත් කාලය ගත කිරීමයි. ආධ්‍යාත්මක අංශය පරිහානියට පත්විය. දූෂිත භික්ෂූන්ගේ ක්‍රියාදමයන් කොරියෝ රාජ්‍ය පමණක් නොව බෞද්ධාගම ද පරිහානියට ලක් කිරීමට ආධාර වූ ප්‍රධානතම කරුණක් විය.

**යි රාජ පරම්පරාව යටතේ බුද්ධගාම**

යි රාජ පරම්පරාව තම රාජ්‍ය පාලනය ගෙන ගියේ කොරියාවෙහි සෝල් නගර–යෙහිය. (ක්‍රි. ව. 1392–1910) යි රාජ පරම්පාරව පිළිගත්තේ කොන්ෆියුසියානු චින්–තනයයි.[12] බෞද්ධාගමට යි රජවරුන්ගෙන් ලැබුනේ නොවැදගත් තැනකි. යි රජ–වරුන් සේජෝ, වියුන්ජෝන් සහ සුන්ජෝ යන රජවරුන් හැරෙන්නට ඒ පරම්පාවෙහි සියළු රජවරු බෞද්ධ විරෝධි ආකල්පයකින් ක්‍රියා කළහ.

මේ අවධියෙහි බෞද්ධ කටයුතු සම්පූර්ණයෙන් ම ඇන හිටියේය. රාජ අනුග්‍රහය නොලැබිය. උගත් බෞද්ධ භික්ෂූන්ගේ කටයුතු සම්පූර්ණයෙන් අඩපණ වූ අතර, නගර වල බෞද්ධ විහාරස්ථාන අඩුවිය. මේ යුගයෙහි භික්ෂූන් වහන්සේලා වඩාත් යොමු වූයේ භාවනානුයෝගී ජීවිතයක් ගත කිරීම පෙරදැරි කොටගත් 'සෙන්' හෙවත් 'ධ්‍යාන' නිකාය වෙතටයි. මේ නිසා ඔවුන් වඩා ජනාකීර්ණ ප්‍රදේශවලින් ඈත්වීමට ක්‍රියා කළෝය.

යී රාජ පරම්පරාවේ ප්‍රථමයා වූ ටේජෝ (ක්‍රි. ව. 1392–1398) කොන්ෆියුසියානු චින්තනය පිළිගත් අතර රාජ්‍යයෙහි සෞභාග්‍ය ලබාගැනීමේ පරමාර්ථයෙන් බෞද්ධ විහාරස්ථාන සඳහා ආධාර කළේ ය. එසේ වුවද ක්‍රි. ව. 1399–1400 අතර කාලයෙහි රජ වූ චුං ජොං රජතුමා බෞද්ධ කටයුතු අඩපණ කිරීමට ප්‍රබල උත්සාහයක් ගත්තේය. විහාරස්ථාන සඳහා වෙන් කරනු ලැබූ ඉඩම් තහනම් කිරීමටත් අළුතින් ඉඩම් ලබා නොදීමටත් ක්‍රියා කළේ බෞද්ධ බලය අඩුකිරීමක් වශයෙනි. එසේම රජවාසල සමඟ භික්ෂූන් වහන්සේලා පැවැති සම්බන්ධතාවයන් ද අඩු කිරීමට පියවර ගත්තේය.

සේජොන් රජතුමා (ක්‍රි. ව. 1419–1450) විසින් ගත් වැදගත් ක්‍රියාමාර්ගයක් නම් නිකාය හතක් වශයෙන් පැවැති කොරියානු බෞද්ධ චින්තනය සොන් සහ කියෝ නම් නිකාය දෙකට සීමා කිරීමය. මෙය එක් අතකින් කොරියානු බුද්ධාගමෙහි පැවැති නිකාය භේදය සමථයකට පත් කිරීමට ආධාර වූ පියවරක් ලෙස සැලකිය හැකිය. යී රාජ්‍ය සමයෙහි බෞද්ධ භික්ෂූන් සඳහා විභාග ක්‍රමයක් ඇති කරනු ලැබීය. මෙම පරීක්ෂණ මගින් ධර්මඥානය පිළිබඳ තක්සේරු කරගැනීමට හැකිවූ අතර ඒ අනුව ඔවුන් රජයේ පිළිගැනීමට පාත්‍ර විය. යුන්සුන් රජතුමා විසින් (ක්‍රි. ව. 1495 1505) බෞද්ධ උත්සව වෙනුවට කොන්ෆියුසියානු උත්සව ජනතාවට හඳුන්වාදෙනු ලැබීය. ඔහුගේ නියෝගය අනුව කියෝ සහ සොන් මූලස්ථාන සොල් අගනුවරින් බැහැර යොන්ජු නගරයට මාරු කරනු ලැබීය.

යී රාජසමයෙහි සිදුවූ වැදගත් කරුණක් නම් ක්‍රි. ව. 1592 දී සිදුවූ ජපන් ආක්‍රම-ණයයි. හිඳෙයොෂි යටතේ සිදුවූ මෙම ආක්‍රමණ කොරියානු පිරිස් එකතු කිරීමට හේතුවූ කරුණකි. බෞද්ධ ජනතාව පමණක් නොව භික්ෂූන් වහන්සේලා ද මෙම ආක්‍රමණයට එරෙහිව යුද්ධමය ක්‍රියාමාර්ගයන්ට ප්‍රවිශ වූ බව පෙනේ. මෙය බෞද්ධ ජනතාව ජාතික කර්තව්‍යයකට එකතු වූ මහඟු අවස්ථාවකි.

## ක්‍රි. ව. 1910 න් පසු කොරියානු බුද්ධාගම

සොල් නගරයෙහි බිහිවූ යී රාජ සමය බෞද්ධාගමේ පරිහානි යුගයක් ලෙස සැලකිය හැකිය. රාජ අනුග්‍රහය යටතේ නැවත බෞද්ධාගම ප්‍රතිෂ්ඨාපනය කිරීම දුෂ්කර කාර්යයක් විය. කාලයක් තිස්සේ සිදුවූ බෞද්ධ විරෝධී ක්‍රියා නැවත බෞද්ධ කටයුතු සඳහා ළං කරගැනීමට මහත් බාධාවක් විය.

1910 දී ජපන් රට විසින් කොරියාව යටත් කරගැනීම බෞද්ධ කටයුතුවල නව පෙරළියක් විය. ජපන් බෞද්ධ නිකායන්ට සම්බන්ධ බෞද්ධ නිකාය කොරියාවට හඳුන්වාදුන් අතර මේ ක්‍රියාවන්ට කොරියානු බෞද්ධයන්ගේ පළවූයේ අප්‍රසාදයකි. ජපන් විරෝධී ආකල්පය කොරියානු නිදහස් ව්‍යාපාරයට මහත් අනුබලයක් විය. එම ව්‍යාපාරයන් පිටුපස බෞද්ධ බලවේගයන්ද ක්‍රියාත්මක වූ බව කිව යුතුය. ක්‍රි. ව. 1945 දී සිදුවූ ජපන් පරාජයත් සමඟ කොරියානු බෞද්ධ ව්‍යාපාරයන් නව අතකට යොමු විය.

දැනට කොරියාවේ බෞද්ධයන් ජනගහනයෙන් තුනෙන් එකක් පමණ සිටී. බෞද්ධ පන්සල් සංඛ්‍යාව 1983 සංඛ්‍යාන අනුව 7,244 කි. භික්ෂූන් වහන්සේලා

ගණන 22,200 කි. කොරියාවේ ප්‍රධානතම බෞද්ධ නිකාය නම් චෝගේ නිකායයි. මෙම නිකායට එරට ප්‍රධාන බෞද්ධ සිද්ධස්ථාන සියල්ලම පාහේ ඇතුළත්ය.

කොරියාවේ බෞද්ධාගම ව්‍යාප්තවීම හේතුකොටගෙන ලෝක බෞද්ධ සංස්කෘතියට සිදුවූ සේවාවන් කිහිපයක් දැක්විය හැක.

1. මහායාන බෞද්ධ සම්ප්‍රදයට අයත් පොත්පත් රාශියක් පළකිරීම. විශේෂයෙන්ම ත්‍රිපිටක කොරියානා නම් වූ කොරියානු ත්‍රිපිටකය පළ කිරීම මේ අතර සිදුවූ වැදගත් කාර්යයකි.

2. බෞද්ධ අදහස් උදහස් සඳහා ස්වකීය මත ඇසුරින් ගැඹුරු අධ්‍යයනයන්හි නිරත වූ වොන්හ්යෝ බොජෝ සහ වොන්ග්චන් වැනි භික්ෂූන්ගේ දර්ශනික අදහස් ඈත පෙරදිග මහත් බලපෑමක් ඇති කළේය.

3. බෞද්ධ කලා ක්ෂේත්‍රයෙහි ඇතිවූ සංවර්ධනය කොරියාව මගින් බෞද්ධ ලෝකයට ඉදිරිපත් කළ වැදගත් සේවාවකි. විශේෂයෙන් ම ශිල්ලා රාජ්‍ය සමයෙහි ඇතිවූ කලා ප්‍රබෝධය පුල්කුක්සා හා සොක්කුරාම් යන ප්‍රදේශවල බෞද්ධ නටඹුන් මගින් වඩාත් ප්‍රකට වේ. මේ කලාවේ විදේශ ආභාසය වඩාත්ම ප්‍රකට වූයේ දකුණු ජපානයෙහිය.

4. ජපන් දූපත්වලට බෞද්ධාගම ප්‍රචලිත වූයේ කොරියානු අර්ධද්වීපය හරහාය. චීන සංස්කෘතිය පමණක් නොව බුද්ධාගම ද ජපානයට ගිය මාර්ගය කොරියාව හරහා වැටී තිබුණි. වර්තමාන ලෝකයේ ප්‍රධානතම බෞද්ධ රටක් වූ ජපානය ඊටම ආවේණික වූ සම්ප්‍රදයයන් රැසක් හඳුන්වා දී ඇත.[14]

මේ නිසා කොරියානු බුද්ධාගම ඊටම ආවේණික වූ ලක්ෂණවලින් වර්ධනයට පත්වී ඇති බව කිව යුතුය. කොරියානු බුද්ධාගම මහායාන සම්ප්‍රදයට අයත් වුවද එය චීනයේ හෝ ජපානයේ මහායාන බුද්ධාගමට වඩා වෙනස්ය. එසේම කොරියානු ජනතාව බෞද්ධ ලෝකයට කර ඇති නිර්මල සේවය අප විසින් අගය කළ යුතුය,

සටහන්:


1 Kim, H. Edward
Facts about Korea
Hollym Corporation, Seoul,
(1985) p, 34-36.

2. Joe J. Wanne
Traditional Korea,
A Cultural History,
Chungang University,
Saoul, (1972) p. 14

3. Samguk-Sagi සහ Samguk Yusa නම් ඓතිහාසික ග්‍රන්ථ දෙක පෞරාණික කොරියානු ස්වාධීන රාජ්‍ය තුන පිළිබඳ ඉතිහාසය මනාව විස්තර කොට ඇත. 1245 දී පමණ Samguk-Yusa නම් ග්‍රන්ථය රචනා කරන ලැබුවේ බෞද්ධ භික්ෂුවක වූ ඉජියොන් විසිනි.

4. Han Woo-keun
The History of Korea
The Eul-woo Publishing Co.
Seoul (1970) p. 64

5. Lee-Ki-Yong
Korea Studies Today
(Religion) Institute of Asian Studies, SNU, Seoul
(1970) p. 9–10

6. Clark, Allen C.
Religions of Old Korea
Christian Literature Society of Korea,
Korea, Seoul (1961) p. 28

7. Osgood Cornelius
The Koreans and Their Culture
Charles E. Turtle Co. Tokyo
(1954) p. 247

8. 1954 ජපානයෙහි Tenrri විශ්වවිද්‍යාලයෙහි Koreanology Bulletin හි Toshio Eda විසින් The Position of the Silla People on Buddhist Dogma and Thought නම් ලිපියෙහි මේ පිළිබඳ විස්තර මනාව ඉදිරිපත් කොට ඇත.

9. U-chong Sand and Kim Yong-tae, Hanguk Pulgyosa, Chinsudang, Seoul (1970)

10, Imanishi, Rgu
An Outline of the Koryo History, Koraishi kenkyu (1944)

11. මහාචාර්ය හන්වූකුන් විසින් Hankuk Sa නම් ග්‍රන්ථයෙහි බෞද්ධ විරෝධී ව්‍යාපාර මගින් කොන්පියුසියානු දර්ශනය කොගිරියෝවෙහි තහවුරු වූ ආකාරය විස්තර කොට ඇත.

12. Gale. G. History of Korea, Presentation of Christianity in Confucian Lands, Korea Mission Field Magazine, April (1925)

13. Min Yong-gyu
'On Won-hyo', Sasaggye, Seoul August (1953)

14. ජපානයෙහි හොරෙයිජි විහාරස්ථානයේ ඇති බිතුසිතුවම් රාශියක්ම සිතුවම් කොට ඇත්තේ කොරියන් භික්ෂුවක් වූ ඩම්ජින් විසිනි. හොරෙයිජි හෙවත් 'ධර්මය ප්‍රභාමත් කරන පන්සල' නම් අර්ථය ඇති දූවයෙන් නිම කළ මෙම විහාරස්ථානය කලාත්මක වශයෙන් ඉතා වැදගත් ස්ථානයක් ලෙස සළකනු ලැබේ. එය කොරියානු බෞද්ධ ආභාසය මනාව ප්‍රකට කරන ස්ථානයකි.